# සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන උසස් කිරීම් පරිපාටිය.

MN-4

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

(MN 4 – 2016)

01.සම්බන්ධවන ආයතන

1.1 දෙපාර්තමේන්තුව :අදාළ නොවේ

| | | යොමු අංකය | දිනය |
|---|---|---|---|
| 1.2 අමාත්‍යාංශය | : සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | 07/B/MN-4/PS/2015 | දිනය:-2019.06.08 |
| 1.3 කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | | DMS/0054 | දිනය:-2013.12.31 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | :EST/2/02/REC/0942 | දිනය:-2019.02.12 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | NSCC/4/13/SR-7 | දිනය:-2018.11.29 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | : PSC/EST/06-01-13/02/2019 | දිනය:-2019.10.29 |

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම්

03.සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය :ආශ්‍රිත නිලධාරී

3.2 ශ්‍රේණි :III, II සහ I

3.3 පැවරෙන කාර්ය භාර්ය පිළිබඳ පොදු නිර්වචනය : සෞඛ්‍ය ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්ය භාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම/ විශ්ලේෂණය/සම්පාදනය, වාර්තා සම්පාදනය, සමීක්ෂණය වැනි කාර්යයන් අතුරින් නිශ්චිත කාර්යභාරයක් වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්ය භාරයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04.තනතුරෙහි / තනතුරු වල ස්වභාවය :ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 4 - 2016

5.2 වැටුප් පරිමාණය :31,490 – 10 x 445 – 11 x 660 – 10 x 730 – 5 x 750 -54,250

5.3 ශ්‍රේණි ක්‍රමියට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු:) |
|---|---|---|
| III | පියවර 01 | 31,490 |
| II | පියවර 12 | 36,600 |
| I | පියවර 23 | 43,930 |

වැටුප් ගෙවීම හා අනිකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සංවර්ධන සහකාර | III<br>II<br>I | 29 | ➢ රෝහල් සහ විවිධ සෞඛ්‍ය ආයතන මඟින් සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය උසස් කරලීම පිණිස මානසික සෞඛ්‍ය පෝෂණය, ලේඛණාගාරය, මූල්‍ය, රුධිර පාරවිලයනය, සැළසුම්කරණය, සෞඛ්‍ය අධ්‍යාපනය, පර්යේෂණ සහ මානව සම්පත් කළමණාකරණය යන ක්ෂේත්‍රයන් මඟින් තම සේවය ලබා දීම.<br>➢ ආයතන ප්‍රධානීන් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |
| සැලසුම් හා වැඩසටහන් සහකාර | | 13 | ➢ සෞඛ්‍ය මිනිස් බල යටිතල පහසුකම්, ගිලන්වීම, මරණ සංඛ්‍යාව සහ සෞඛ්‍ය සැළසුම් සහ කළමනාකරණය පිළිබඳ අනෙකුත් විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව දත්ත රැස් කිරීමට සහය වීම<br>➢ සෞඛ්‍ය සංවර්ධනය සඳහා යථා දර්ශන සකස් කිරීම සඳහා සැළසුම් හා වැඩසටහන් නිලධාරීන්ට සහය වීම.<br>➢ අය වැය විවාදය සඳහා අමාත්‍යාංශය ආයතනවල කාර්ය සාධන වාර්තා සකස් කිරීමට සැළසුම් හා වැඩ සටහන් නිලධාරීන්හට සහය වීම<br>➢ පළාත්, කොට්ඨාශ සෞඛ්‍ය සැළසුම් සකස් කිරීමට සහය වීම<br>➢ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය/ පළාත්/ ආයතන යටතේ ඇති සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ තත්වයන් ඇතුළත් ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික සමාලෝචන වාර්තා සකස් කිරීමට සහය වීම.<br>➢ කෙටි/මධ්‍ය කාලීන සෞඛ්‍ය සංවර්ධන සැළසුම් සකස් කිරීමට සහය වීම්.<br>➢ රාජ්‍ය ආයෝජන වැඩ සකස් කිරීමට සහය වීම.<br>➢ විවිධ සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති සැළසුම් සකස් කිරීමට සහය වීම.<br>➢ ක්‍රියාකාරී සැළසුම්/වාර්ෂික වැඩ සැළසුම් සකස් කිරීමට සහය වීම හා සැපයීම් පුහුණු වැඩ සටහන වැඩමුළු සම්මන්ත්‍රණ ආදිය සම්බන්ධයෙන් ව්‍යාපෘති නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අය වැය පරීක්ෂා කිරීමට හරි වැරදි බැලීමට සහය වීම. |

| | | | |
|---|---|---|---|
| | | | ➢ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා කටයුතු පිළියෙල කිරීමට සහය වීම.<br>➢ වැඩසටහන් සැලසුම් කිරීමට, අදාල වාර්තා සහ දත්ත පදනම් පිළියෙල කිරීමට සහය වීම.<br>➢ ව්‍යාපෘති පරීක්ෂා කිරීමට සහ ඇගයීමට සහය වීම, පර්යේෂණ කටයුතු වලට සහය වීම.<br>➢ ආයතන ප්‍රධානීන් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |
| මහජන සම්බන්ධීකරණ සහකාර | | 05 | ➢ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ රෝහල් සේවයට අදාළව උසස් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීම සඳහා රෝහල් වල මානව සම්පත් කළමනාකරණය සඳහා සහය වීම.<br>➢ රෝහල් වෙත පැමිණෙන මහජනයාට මුහුණ පෑමට සිදුවන්නා වූ දුෂ්කරතාවයන් නිරාකරණය කරලීමට අවශ්‍ය පියවර ගැනීම.<br>➢ ආයතන ප්‍රධානීන් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන සහකාර | 29 |
| සැලසුම් හා වැඩසටහන් සහකාර | 13 |
| මහජන සම්බන්ධීකරණ සහකාර | 05 |

07. බඳවා ගැනීමේ ක්‍රමය : අදාල නොවේ.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධර සේවා ගණයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල නොකරන ලද නිලධාරීන්ට පෞද්ගලික වන සේ සකස් කරනු ලැබූ උසස් කිරීමේ පරිපාටියකි.මෙම තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු නොකරනු ලබන අතර, ඉදිරියේ දී ඇති වන පුරප්පාඩු සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගෙන් පමණක් සම්පූර්ණ කරනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය<br>ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (3) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (3) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (5) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශ ලේකම්. විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | |

9. භාෂා ප්‍රවීණතාව :

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ දී ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 .III වන ශ්‍රේණියේ සිට IIශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1.සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව II ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ

10.2.II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධනය ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:
අදාළ නොවේ

13.රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය: (ඇමුණුම 04)

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන :

17.1. අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම උසස් කිරීම් පරිපාටියට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් සඳහා මෙහි සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා වසර තුන (03) ක සහන කාලයක් ලබා දෙනු ඇත. එම කාලය තුළ ඔවුන් විසින් මෙම උසස්කිරීමේ පරිපාටියේ ඇතුලත් කර ඇති අවශ්‍යතා සපුරා ගත යුතුය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණයට පෙර එම නිලධාරීන් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සමත්ව ඇත්නම් මෙම උසස්කිරීම් පරිපාටියේ සඳහන් අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය හෝ විෂයානු බද්ධ පරීක්ෂණය යන ප්‍රශ්න පත්‍රය සමත් වීම, මෙම උසස් කිරීම් පරිපාටියේ III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය) සමත් වීමක් ලෙස සැලකේ.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම ලෙස සඳහන් විභාගයට අමතරව මෙම උසස් කිරීම් පරිපාටිගේ සඳහන් II හා III කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට මින් පෙර පෙනී සිට සමත් වීම, මෙම උසස් කිරීම් පරිපාටියේ සඳහන් II හා III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීමක් ලෙස සැලකේ.

17.2. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාප පළ නොකරන නිලධාරීන්ට පෞද්ගලික වන සේ පමණක් මෙම තනතුරු පවතින අතර, එවැනි තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට එම තනතුරු නාමය යටතේ බඳවා ගැනීම නොකළ යුතුය.

බඳවා ගැනීම් කළ යුත්තේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ පමණකි.

| | |
|---|---|
| සකස් කළේ:- ........ | පරීක්ෂා කළේ:- ........ |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා) |
| නම :- එල්.එල්.සී.ලොකුගේ | නම :- සිරිමල් ලොකුගමගේ, |
| තනතුර :- අධ්‍යක්ෂ (පාලන) VII | තනතුර :-නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I |
| දිනය :- 2020.07.22 | දිනය :- 2020.07.24 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :- ........

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

තනතුර :-සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය :- 2020-07-29

නිල මුද්‍රාව:- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN -4 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

---

යොමු අංකය - 07/B/MN-4/PS/2015

අත්සන :- ........

නම :- වෛද්‍ය එස්.එච්.මුණසිංහ

තනතුර :-ලේකම්,සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

දිනය :- 2020/07/31

නිල මුද්‍රාව:- වෛද්‍ය එස්. එච්. මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

---

යොමු අංකය - PSC/EST/06-01-06/02/2019

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය MN -4 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය 2019.10.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :- ........

නම :- එම්. ඒ. බී. දයා සෙනරත්

තනතුර :-ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :- 2020.09.03

නිල මුද්‍රාව:- එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

ඇමුණුම 01

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන තනතුරු (MN-4-2016) සඳහා වන පළමු කාර්යක්මතා කඩඉම් පරීක්ෂණය

1. විභාගයේ නම:- පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම | පැය 02 යි | 100 | 40% |
| 2. ගිනුම් ක්‍රම | පැය 02 යි | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමන කාලසීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්
5. විභාග සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විශය නිර්දෙශය |
|---|---|
| 1. කාර්යාල ක්‍රම | තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව මැන බැලීම.<br><br>• ආයතන සංග්‍රහයේ :-<br>II පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සහ පත් කිරීම<br>III පරිච්ඡේදය - මාරු කිරීම<br>VII පරිච්ඡේදය - වැටුප්<br>VIII පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු සඳහා වැටුප් හා දීමනා<br>XII පරිච්ඡේදය - නිවාඩු<br>XIII පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV පරිච්ඡේදය - දිවයින ඇතුළත රාජකාරි ගමන්<br>XVI පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXVII පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේදය -රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XLVII පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br><br>• අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ<br><br>XII පරිච්ඡේදය - පත් කිරීම<br>V පරිච්ඡේදය - රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්<br>VI පරිච්ඡේදය - පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් කොන්දේසි<br>VII පරිච්ඡේදය - පත් කිරීම් වලදී අනුගමනය කල යුතු පටිපාටිය<br>VIII පරිච්ඡේදය -පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම් ස්ථිර කිරීම<br>XIV පරිච්ඡේදය - පත්වීම් අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම<br>XV පරිච්ඡේදය - තනතුර අතහැර යාම<br><br>රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් 04කට පිළිතුරු සැපයියි යුතුය. |

| | | |
|---|---|---|
| 2. | ගිණුම් ක්‍රම | තනතුරට ආදාළ වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත් වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම<br><br>මුදල් රෙගුලාසි සංග්‍රහයේ :<br>I පරිච්ඡේදය -වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>II පරිච්ඡේදය -වියදම්, අතහැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාරී බලය<br>III පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිනුම් ගත කල හැකි වීම<br>IV පරිච්ඡේදය -ලැබීම්<br>V පරිච්ඡේදය - ගෙවීම්<br>VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්<br><br>රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් 04කට පිළිතුරු සැපයියි යුතුය. |

සකස් කළේ:-.......................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම :- එල්.එල්.සී.ලොකුගේ
තනතුර :- අධ්‍යක්ෂ (පාලන) VII
දිනය :- 2020.07.22

පරීක්ෂා කළේ:-.......................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම :- සිරිමල් ලොකුගමගේ,
තනතුර :-නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I
දිනය :- 2020.07.24

අත්සන :-.......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
තනතුර :-සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව:- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය :- 2020-07-29

ඇමුණුම 02

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන තනතුරු (MN-4-2016) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. විභාගයේ නම:- දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයය දැනුම | පැය 02 යි | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමන කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. විභාග සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විෂයය දැනුම | එක් එක් තනතුරට අදාල ක්ෂේත්‍ර අනුව ප්‍රශ්න පත්‍රය සැකසේ<br>• රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් 04 කට පිළිතුරු සැපයිය යුතුය |

සකස් කළේ:- (signature)

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- එල්.එල්.සී.ලොකුගේ

තනතුර :- අධ්‍යක්ෂ (පාලන) VII

දිනය :- 2020-07-22

පරීක්ෂා කළේ:- (signature)

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- සිරිමල් ලොකුගමගේ,

තනතුර :-නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I

දිනය :- 2020.07.24

අත්සන :- (signature)

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

තනතුර :-සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය :- 2020-07-29

නිල මුද්‍රාව:- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම 03

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන තනතුරු (MN-4-2016) සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. විභාගයේ නම:- තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රයේ නම | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සිද්ධි අධ්‍යයනය | පැය 03 යි | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක්
4. .විභාගය පවත්වනු ලබන්නේ කොපමන කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්
5. විභාග සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සිද්ධි අධ්‍යයනය | එක් එක් ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමඟින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලීත්වය ගැටළු විශ්ලේෂණය යනාදිය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.<br><br>• ප්‍රශ්න 08 කින් 05 කට පිළිතුරු සැපයිය යුතුය. |

සකස් කළේ:-.......................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- එල්.එල්.සී.ලොකුගේ

තනතුර :- අධ්‍යක්ෂ (පාලන) VII

දිනය :- 2020.07.22

පරීක්ෂා කළේ:-.......................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- සිරිමල් ලොකුගමගේ,

තනතුර :-නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I

දිනය :- 2020.07.24

අත්සන :-.......................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

තනතුර :-සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය :- 2020-07-29

නිල මුද්‍රාව:- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම 04

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන තනතුරු (MN-4-2016) වල නිලධාරීන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය.

<u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම</u>

(මෙම උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට සහ මෙම අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරී සේවයට බඳවාගත් / සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් හැරුණු කොට මෙම අමාත්‍යාංශයට විටින් විට උපාධිධාරී යෝජනාක්‍රමය මත බඳවාගත් උපාධිධාරී නිලධාරීන්ට පමණක් අදාළ වේ)

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව MN4 – 2016 පරිමාණයෙහි වැටුප් හිමි තනතුරක සේවයේ නියුතු, එම තනතුරෙහි ස්ථිර කරන ලද නිලධරයන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. කෙසේ වෙතත්, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධරයාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධකයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන්ම නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරකට අනුරූපී වීම මත, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

i. MN -4 -2016 III ශ්‍රේණිය

(අ) MN-4-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට, අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

MN – 4 -2016 III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. MN -4 -2016 II ශ්‍රේණිය

(අ) MN-4-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10කට නොඅඩු එහෙත් අවුරුදු 20 කට නොවැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්.

(ආ) MN-4-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 10ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

MN – 4 -2016 II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

iii. MN -4 -2016 I ශ්‍රේණිය

(අ) MN-4-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියක අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්

(ඇ) MN-4-2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවය කරන, වසර 20කට වැඩි සක්‍රිය සේවා කාලයක් සහිත නිලධාරීන්

MN – 4 -2016 I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ:-..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- එල්.එල්.සී.ලොකුගේ

තනතුර :- අධ්‍යක්ෂ (පාලන) VII

දිනය :- 2020.07.22

පරීක්ෂා කළේ:-..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :- සිරිමල් ලොකුගමගේ,

තනතුර :-නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I

දිනය :- 2020.07.24

අත්සන :-..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ

තනතුර :-සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය :- 2020-07-29

නිල මුද්‍රාව විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/06-01-13/02/20
ඔබේ අංකය / உமது இல. / Your No.: 07/B/01/07/06/2021
දිනය / திகதி / Date: 2023.04.19

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION
අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

අධ්‍යක්ෂ (පාලන) 07
24 APR 2023
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10.

1428576

Add. Secy (Adi - I)

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

<u>වෛද්‍ය ලේඛන සහකාර නිලධාරීන් MN-4 ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටියට අන්තර්ග්‍රහණය කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2022.11.09, 2023.02.28 දිනැති ලිපි හා බැඳේ.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටි කෙටුම්පතට මෙම ලිපිය සමඟ අමුණා ඇති ඇමුණුම් 01 හි සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.04.10 දින අනුමත කර ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි. (ඇමුණුම 1- පිටු 01කින් යුක්තය.)

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් උසස් කිරීමේ පටිපාටියෙහි සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ටී.ඩබ්ලිව්. ගයාන්

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත -

ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැන ගැනීම සඳහා

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය සඳහා වන උසස් කිරීම් පටිපාටිය

සංශෝධන ලැයිස්තුව 02

<table>
<tr><th>අනු අංකය</th><th>වගන්තිය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>1</td><td>1.6</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට පහළින් පහත කරුණු ඇතුළත් කරන්න<br>පළමු සංශෝධනය : PSC/EST/06-01-13/02/2019 දිනය: 2022.09.29<br>දෙවන සංශෝධනය : PSC/EST/06-01-13/02/2019 දිනය: ..................</td></tr>
<tr><td>2</td><td>06</td><td>6.1 යටතේ දැක්වෙන වගුවට පහත තනතුර ද ඇතුළත් වේ.
<table>
<tr><th>අනුමත තනතුරු නාමය</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>වෛද්‍ය ලේඛන සහකාර</td><td>I, II, III</td><td>53</td><td>රෝගීන් සම්බන්ධයෙන් සිදු කරනු ලබන සියලුම සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම<br>අදාළ දත්ත රැස් කිරීමට සහාය වීම, රෝගී සත්කාර සේවයට අදාළ වර්තාවල තත්ත්වය ඇගයීමේදී වෛද්‍ය කාර්ය මණ්ඩලයට සහාය වීම, එවැනි ඇගයීම් කටයුතු සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම<br>ආයතන ප්‍රධානීන් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම</td></tr>
</table>
6.2 වගුවට පහත තනතුර ද ඇතුළත් වේ.
<table>
<tr><th>තනතුර</th><th>තනතුරු සංඛ්‍යාව</th></tr>
<tr><td>වෛද්‍ය ලේඛන සහකාර</td><td>53</td></tr>
</table></td></tr>
<tr><td>3</td><td>17</td><td>මෙම බඳවා ගැනීමේ පටිපාටියට අන්තර්ග්‍රහණය වන වෛද්‍ය ලේඛන සහකාර නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම සහ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා දෙවන සංශෝධනය අනුමත වූ දින සිට වසර 3ක කාලයක් ලබා දෙනු ලබන අතර බඳවා ගැනීමේ පටිපාටියේ අන්තර්කාලීන විධිවිධාන යටතේ දක්වා ඇති අනෙකුත් සියළුම කරුණු වෛද්‍ය ලේඛන සහකාර නිලධාරීන් සඳහාද අදාළ වේ.</td></tr>
</table>

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/06-01-13/02/2019

ඔබේ අංකය / உமது இல. / Your No.: 07/B/01/01/04-2/2021

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

දිනය / திகதி / Date: 2024.10.04

1540458.

DDG(Ad) I

07 OCT 2024

08 OCT 2024

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශය කොළඹ 10.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධර ගණය MN-04-2016 (ඒ)සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සංශෝධනය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2024.04.27 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.10.29 දින අනුමත කරන ලද ආශ්‍රිත නිලධාරි සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටියට මෙහි ඇමුණුම 01 හි (පිටු 01 කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට 2024.10.02 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පටිපාටියෙහි සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

දේශමාලි කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් - ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැන ගැනීම සඳහා

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය MN – 4 – 2026 (ඒ) සඳහා වන උසස් කිරීම් පටිපාටිය

සංශෝධන ලැයිස්තුව -03 වන සංශෝධනය

<table>
<tr><th>අනු අංකය</th><th>වගන්තිය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>01.</td><td>ඇමුණුම 01<br><br>5.විභාගය සඳහා වන විෂය නිර්දේශය</td><td>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විශය නිර්දේශය</th></tr>
<tr><td>1. කාර්යාල ක්‍රම</td><td>තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව මැන බැලීම<br><br>● ආයතන සංග්‍රහයේ :<br>VI පරිච්ඡේදය - සේවා ලේඛන වාර්තා සහ සහතික<br>VII පරිච්ඡේදය - වැටුප්<br>VIII පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දින සහ නිවාඩු දින සඳහා වැටුප් හා දීමනා<br>XII පරිච්ඡේදය - නිවාඩු<br>XIII පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIV පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්<br>XVI පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXIV පරිච්ඡේදය - වැටුප්, ණය හා අත්තිකාරම්<br>XXVII පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග<br>XXVIII පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේදය - රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XLVII පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br><br>● අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පරිපාටික රීති<br><br>රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් 04 කට පිළිතුරු සැපයිය යුතුය.</td></tr>
</table>
</td></tr>
</table>

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) 07/B/MN – 4/PS/2015
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2021.01. 15
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියලුම ආයතන ප්‍රධානීන් වෙත

**<u>MN – 4 ආශ්‍රිත නිලධාරී ගණය සඳහා වන නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.</u>**

MN – 4 ආශ්‍රිත නිලධාරී සේවා ගණය යටතට ගැනෙන සංවර්ධන සහකාර,සැලසුම් හා වැඩසටහන් සහකාර හා මහජන සම්බන්ධීකරණ සහකාර නිලධාරීන්ට අදාල උසස් කිරීමේ පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර එම උසස් කිරීමේ පරිපාටිය මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව ඔබ ආයතනයේ සේවයේ නියුතු 1999 හා 2005 වර්ෂ වල උපාධිධාරී යෝජනා ක්‍රමය යටතේ බඳවා ගන්නා ලද ඉහත තනතුරු වලට අදාල, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ නොකරන ලද නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ඇමුණුම 01 හි අයදුම්පත හා ඇමුණුම 02 ආකෘතිය සම්පූර්ණ කර පහත සඳහන් ලේඛන වල සහතික කරන ලද පිටපත් ද සහිතව යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

I. උප්පැන්න සහතිකය
II. ජාතික හැඳුනුම්පත
III. පත්වීම් ලිපිය
IV. සේවයට වර්තා කළ ලිපිය
V. පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
VI. කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල ලේඛන
VII. කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා ඇති නම් හෝ ඉල්ලුම් කර ඇති නම් එම අදාල ලේඛන
VIII. යථාවත් කරන ලද චර්යා සටහන
IX. තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් ලද උපාධි සහතිකය

සිරිමල් ලොකුගමගේ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
ලේකම් වෙනුවට.

සිරිමල් ලොකුගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ MN – 4 ආශ්‍රිත නිලධාරි ගණය සඳහා වන උසස් කිරීමේ පරිපාටියට අනුව සේවයේ යෙදී සිටින නිලධරයන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.

1. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ..........
2. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........
3. පත්වීම ස්ථිර කර ඇත/නැත :- ..........
4. වර්තමාන තනතුරු නාමය :- ..........
5. තනතුරට පත් වූ දිනය :- ..........
6. දැනට සේවය කරන ආයතනය :- ..........
7. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් / අසමත් බව :- ..........
8. සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත :- ..........
9. පත්වීම ලද්දේ මධ්‍යම රජය යටතේ ද/ පළාත් රාජ්‍ය සේවය යටතේ ද යන වග :- ..........
10. පළාත් රාජ්‍ය සේවයේ නම් මධ්‍යම රජයට අන්තර්ග්‍රහණය වී ඇත/නැත :- ..........
11. මධ්‍යම රජයට අන්තර්ග්‍රණය වී ඇතිනම් ලිපි අංකය හා දිනය :- ..........
12. විනය කටයුතු තිබේ නම් ඒ පිළිබඳ විස්තර :- ..........
13. අධ්‍යාපන සුදුසුකම්
    - උපාධිය :- ..........
    - ලබා ගත් විශ්ව විද්‍යාලය :- ..........
    - වර්ෂය :- ..........

14. සේවය කඩවීම් වී තිබේ නම් ඒ පිළිබඳ විස්තර
    - සේවය හැරයාම්

| සේවය හැරගිය දිනය | නැවත සේවය ලබාදුන් දිනය |
|---|---|
| | |
| | |

- විදේශ ගතවීම්/වෙනත් :- ..........

15. සම්පූර්ණ ස්ථිර සේවා කාලය
(2019.10.29 දිනට)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය :- .......... ..........

ඉල්ලුම්කරුගේ අත්සන

---

පෞද්ගලික ලිපි ගොනුවට අනුව ඉහත සඳහන් කළ තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය :- .......... ..........

විෂය භාර නිලධාරී

---

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-

මෙම නිලධාරියාගේ මත අදාල ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි.

දිනය :- .......... ..........

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය/ නිල මුද්‍රාව

| අනු අංකය | නිලධාරියා/නිලධාරිණියගේ නම | උපන් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | ස්ථිර කරන ලද දිනය | තනතුර | පත්වීම් දිනය | සේවා කාලය (2019.10.29 දිනට) | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | සමත්/අසමත්, පෙනී සිට ඇත/නැත | සමත් නම් දිනය |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

සකස් කළේ :-

තනතුර :-

පරීක්ෂා කළේ :-

තනතුර :-

.............................................

අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරි

නිල මුද්‍රාව